

## සායනයේදී මට මුනගැසෙන්නේ වෙන කවුරුන්'ද?

ඔබේ හමුවන වේලාව සායන සම්බන්ධිකරු විසින් පිලියෙල කරනු ඇත. සායන ජාන වෛද්‍යවරයාට අමතරව, වෛද්‍ය තොරතුරු තේරුම් ගැනීමටත් ඒවා ඔබටත් ඔබේ පවුලටත් බලපාන්නේ කෙසේද යන්න අවබෝධ කරගැනීමටත් උදව් විය හැකි ජාන උපදේශකයෙකු ද මුණගැසිය හැකිය. අවශ්‍යවුවහොත් චිත්තවේගීය සහාය හා ප්‍රායෝගික දැනමුතුකම් ලබා ගැනීමට සමාජ සේවක යෙකුද සිටිය හැකිය.

සමහර තත්ත්ව වලදී හරදරෝග විශේෂඥයෙක්,, අස්ති පිළිබඳ විශේෂඥයෙක් හෝ පෝෂණ වේදියෙකු වැනි වෙනත් විශේෂඥයින් උදව් විය හැකිය. වෛද්‍ය ශිෂ්‍යයින්, ජාන උපදේශන සිසුන් හෝ සමාජ සේවා පිළිබඳ සිසුන් හමුවන වේලාවට සමබන්ධ වීමට අවසර ඉල්ලා සිටිය හැකිය. ඔබ මේ ගැන අසතුටක් ඇත් නම් ප්‍රතික්ෂෙප කිරීමට කරුණාකර නිදහස ලබාගන්න.

## එයට  කොපමණ මුදලක් වැය වේද?

ඔබේ හමුවීමට ගෙවීමක් නොමැත. වික්ටෝරියාවේ නොමැති පරීක්ෂණ වෙතොත් ඒවාට ගෙවීමට හෝ දායකවීමට ඔබට සිදුවිය හැකිය.

## මගේ හමුවීමෙන් පසු කුමක් සිදුවේද?

ඔබට සහ ඔබව යොමුකළ වෛද්‍යවරයාට සාරාංශ ලිපියක් යවනු ඇත. ඔබේ පරීක්ෂණ ප්‍රතිඵල යැවීමට කැමති ස්ථානය හමුවන අවස්ථාවේදී නිශ්චිතව ප්‍රකාශ කරන්න.

ජාන තත්ත්වයක් අනාවරණය වීම ජීවිතය වෙනස්කරණසුළු අත්දැකීමක් විය හැකිය. ඔබට තවදුරටත් ප්‍රශ්න හෝ සැලකිළිමත් වන යමක් ඇතොත්  නැවතත් ඔබව බලන ලෙස ඉල්ලා සිටිය හැකිය. වික්ටෝරියානු ජාන සහාය ජාලය (The Genetic Support Network of Victoria (GSNV) තොරතුරු, සහාය සහ උපදෙස් සපයයි. අමතන්න.GSNV (03) 8341 6315 Voice / TTY හෝ info@gsnv.org.au

## මා තෘප්තිමත් නොවේ නම් කුමක්ද?

ඔබේ හමුවීමේ කිසියම් කොටසක් ගැන තෘප්තිමත් නොවේ නම් හෝ ඔබට යම්කිසි ප්‍රශ්නයක් ඇත්නම් කරුණාකර අපට දන්වන්න. ලිඛිත පැමිණිළි වික්ටෝරියානු ජාන සෞඛ්‍ය සේවාවේ සම්බන්ධීකරණ නිලධාරියා වෙත යවන්න.

තවදුරටත් තොරතුරු සඳහා හෝ යොමුවක් ලබාගැනීම සඳහා ඔබේ ළඟම කාර්යාලය අමතන්න.

| | |
|---|---|
| **මෙල්බර්න් නගරය** | |
| රෝයල් ළමා රෝහල | 03 8341 6278 |
| රෝයල් කාන්තා රෝහල | 03 9344 2121 |
| මොනෑෂ් වෛද්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය | 03 9594 2026 |
| ෆ්‍රෑන්ක්ස්ටන්  රෝහල | 03 9594 2026 |
| රෝයල්  මෙල්බර්න්  රෝහල | 03 9342 7151 |
| සෙන්ට් වින්සන්ට් රෝහල | 03 8341 6248 |
| ඇල්ෆ්‍රඩ්   රෝහල | 03 8341 6248 |
| ඔස්ටින් හෙල්ත් | 03 9496 3027 |
| **ප්‍රාදේශීය** | 02 6056 0451 |
| වුඩොන්ගා හෝ ශෙපර්ටන | |
| බැලරාට්, බෙන්ඩිගෝ,ජීලෝං | |
| මිල්ඩුරා,  සේල්, ට්‍රාරාල්ගොන්, | 03 8341 6274 |
| වරගුල් හෝ  වර්නබුල | හෝ |
| | 03 8341 6297 |
| **ටැස්මේනියාව** | 03 6222 8296 |

## එම ස්ථානයට ලගාවීම

රෝහල් බොහොමයකම වාහන ගාල්කිරීමට ඇති ඉඩ  සීමාසහිත හෙයින්  කරුණාකර ඔබේ නියම කරගත් වේලාවට මිනිත්තු 20 කට කලින් ළඟාවන්න. හෙල්ත් කෙයාර් කාඩ් පතකට හෝ රැකවරන අවසර දීමනාවක් (Care Allowance Payment) සඳහා සුදුසුකම් ඇති  රෝගීන්ට අඩුකරණ ලද ගාල් කිරීමේ මුදලක් ගෙවීමට අයිතිය ඇත.

වික්ටෝරියානු රෝගී ප්‍රවාහන සහාය වැඩසටහන (VPTAS) රෝයල් ළමා රෝහලේ සිට කිලෝමීටර් 100ක් ඈතින් ජීවත්වන අයට  උපකාර වනු ඇත. මිනිස් සේවා දෙපාර්තමේන්තුවෙන් (DHS) හෝ ජාන සායනයෙන් ඉල්ලුම්පතක් ලබාගන්න.

## ඔබේ අයිතිවාසිකම් දැනගන්න

ඔබේ අයිතිවාසිකම් ආරක්ෂාකිරීමට VCGS වික්ටෝරියානු මිනිස් අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ ප්‍රඥප්තියේ මූලධර්ම වලට එකඟව නිවැරදි තොරතුරු, සහාය, පෞද්ගලිකත්වය සහ රහස්‍යව ලබාදීමට කැපවෙනු ඇත. පෞද්ගලිකත්වය පිළිබඳ අපේ ප්‍රතිපත්තිය පෞද්ගලිකත්වය පිළිබඳ නීතියට එකඟ වේ. ඔබේ වේලාව වෙන්කරගැනීමේදී පිටපතක් ඉල්ලාගන්න.


**වික්ටෝරියානු සායනික ජාන සේවා (VCGS)**

මර්ඩොක් ළමා පර්යේෂණ ආයතනය  ෆෙලමින්ටන් පාර, පාක්විලා, වික්ටෝරියාව 3052

දුරකතන 03 8341 6201 ෆැක්ස් 03 8341 5390  www.genetichealth.vic.net.au

www.vcgspathology.com.au


# වික්ටෝරියානු සායනික ජාන සේවා

Victorian Clinical Genetics Services



Sinhalese

# නිතර අසන ප්‍රශ්න

Frequently Asked Questions?

GENETICHEALTH | VCGSPATHOLOGY

Victorian Clinical Genetics Services



**වික්ටෝරියානු ජාන සෞඛ්‍ය සේවා (VCGS)** සායන සහ විද්‍යාගාර පරීක්ෂණ පවත්වන අතර ජාන තත්ත්ව ඇති පුද්ගලයනට සහ ඔවුන්ගේ පවුල්වලට ඔවුන්ගේ සෞඛ්‍යය සහ ශුභසාධනය ගැන තොරතුරු මත තීරණ ගැනීමට උදව් වීම සඳහා උපදේශනය සහ සහාය සපයනු ලැබේ.

අප මර්ඩොක් ළමා පර්යෙෂණ ආයතනයේ ලාභ නොලබන, ආධාර ලබන, මානුෂික සේවා සහ වෙනත් සෞඛ්‍ය රැකවරණ සපයන්නන් ගේ දෙපාර්තමේන්තුව හා හවුල්ව වැඩකරන සමාගමකි. අපේ සායනික ජාන සේවය වික් ටෝරියාවේ ජාන සෞඛ්‍ය සේවාව යනුවෙන් හැඳින්වේ. එමෙන්ම අපේ විද්‍යාගාර ජාන සේවය (VCGS) ව්‍යාධි විද්‍යාව යනුවෙන් හැඳින්වේ.

**වික්ටෝරියාවේ ජාන සෞඛ්‍ය සේවය** ජාන තත්ත්ව ඇති පුද්ගලයින්ට රෝගී තත්ත්වය හඳුනාගැනීම, අවදානම තක්සේරුකිරීම,කළමණාකරණය සහ උපදේශනය සපයනු ලැබේ. අපගේ කංඩායම, වික්ටෝරියාව හරහා නගරයේ ස්ථාන 11 ක සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 10 ක ආසන්නතම ජාන සේවයක් ලබාදීමට කැපවී සිටී.

සෑම වර්ෂයකම උපතින් ගෙනෙන දුර්වලකම් ඇති වර්ණදේහ ආබාධ, බුද්ධිමය නොහැකියා, ඇටසැකිල්ල හා සම්බන්ධ පඨක තත්ත්ව, පරිවෘත්තීය තත්ත්ව, ස්නායු සහ මාංශපේෂි තත්ත්ව, ලය, බඩවැල් සහ වෙනත් පිළිකා සහ වෙනත් ආරමය තත්ත්ව ඇති පවුල් 10000 කට වඩා වැඩි ගණනකට අපි උපකාර කරමු.

වෛද්‍ය ජාන විශේෂඥයින්, ජාන උපදේශකයින් සහ සමාජ සේවකයින් හා පෝෂණවේදීන්ගේ දායකත්වය ඇතුව අපි වැඩිහිටියන්ට සහ ළමුන්ට දැනුම් දී සහාය වෙමු. අප විසින් අලුතින් උපදින සියලුම ළදරුවන් පරීක්ෂාකරනු ලැබේ. ගර්භණී භාවයක් සැලසුම්කරණ යහපත් සෞඛ්‍යයෙන් යුත් පුද්ගලයිනට, ජෝඩුවලට, දරුඵල නැති, නිතර ගබ්සාවීම් ඇති - in- vitro -fertilisation (IVF) නල ක්‍රමයට ගැබ්ගත් අවස්ථාවල, ගර්භණී. කාළයේදී මත්ද්‍රව්‍ය රසායනික ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය වලට පාත්‍ර වු අයට අප උපදෙස් දෙනු ලැබේ.

**VCGS ව්‍යාධිවිද්‍යාව**, ජාන තත්ත්ව, වර්ණදේහ ආබාධ, පරිවෘත්තිය (metabolism) කෙරෙහි බලපාන තත්ත්ව ගැන, ජාන සෞඛ්‍ය කාර්යමංඩලය සමග හවල්කරුවෙකුසේ ක්‍රියාකරයි.

වික්ටෝරියාවේ සහ ටැස්මේනියාවේ අලුතින් උපදින ළදරුවන් අප පරීක්ෂාකරණු ලැබේ. phenylketonuria (PKU) සහජයෙන් එන අඩි තයිරොයිඩ්භාවය (congenital hypothyroidism) ෆයිබ්‍රොයිඩ් ගෙඩි (cystic fibrosis) එමෙන්ම පරිවෘත්තිය කෙරෙහි බලපාන තත්ත්ව පරීක්ෂණයට ඇතුළත්වේ.

මාතෘ ශ්‍රාවය පරීක්ෂාකිරීම අපේ කංඩායමට, අධික අවදානමක ඇති ගර්භණීභාවය, වර්ණදේහ වල අසාමාන්‍ය තත්ත්ව' විශේෂයෙන්ම මොන්ගෝලභාවය (downsyndrome) ස්නායු නාලයක දෝශයක් spina bifida වැනි තත්ත්ව. හඳුනාගැනීමට ඉඩදෙයි.



VCGS වර්තමාන සහ අනාගත වැඩකරණ ජනතාවට අධ්‍යාපනය සහ පුහුණුව සපයයි.

මර්ඩොක් ළමා පර්යෙෂණ ආයතනය සමග හවුල්වීම මගින් VCGS නව පරීක්ෂණ, තාක්ෂණය සහ ජාන දැනුම සඳහා සංවර්ධනයවන පර්යෙෂණවල ක්‍රියාකාරීලෙස සහභාගි වේ. අප එකතුවී **POSSUM** සංවර්ධනය කර ඇත. රටවල් 50 ක මධ්‍යස්තාන 600 ක භාවිතාවන පරිගණකමය මානසික දුර්වලතා හඳුනා ගැනීමේ පද්ධතියක්

www.possum.net.au

වැඩිදුර තොරතුරු සඳහා



www.genetichealthvic.net.au

www.vcgspathology.com.au

# ජාන සේවා ගැන නිතර අසන ප්‍රශ්න

## මට බලාපොරොත්තුවිය හැක්කේ කුමක්ද?

විශේෂ පුහුණුවක් ලැබු ජාන උපදේශකයෙකු සහ සායනික ජානවෛද්‍යවරයෙකු ඔබගේ සහ පවුලේ සෞඛ්‍ය ඉතිහාසය වාර්තාගත කරනු ඇත. ඔබගේ ඥාතීන්ගේ නම්, උපන්දිනවල් සහ මරණ දිනවල්, මරණයට හේතුව සහ සාමාන්‍ය සෞඛ්‍යය, ආදිය ගැන ඔවුන් ප්‍රශ්න ඇසිය හැකිය. ඔබේ පළමුවෙනි භාෂාව ඉංග්‍රිසි නොවේ නම් පරිවර්තකයෙකු සූදානම්කළහැකිය. ඔබට අමතර සහායට පවුලේ සාමාජිකයෙකු හෝ මිතුරෙකු කැඳවාගෙන ඒම අප නිර්දේශ කරමු.

කායික පරීක්ෂණයක් කිරීම සායනික ජාන වෛද්‍යවරයා ට අවශ්‍යවනු ඇත. ඔබ සැලකිලිමත්වන ඕනැම ලක්ෂණයක් ගැන ඔවුන්ගේ අවධානය යොමුවනු ඇත. ඇවිත් සිටින පවුලේ සාමාජිකයන්ව පරීක්ෂාකිරීමටද ඔවුන් කැමතිවනු ඇත. වඩා කැමතිනම් තමාගේ ලිංගයේම (ස්ත්‍රී / පුරුෂ) වෛද්‍යවරයෙකු ඉල්ලා සිටිය හැකිය.

බොහෝවිට එකම ගොඩනැගිල්ලක ඇති තැනකින් ලේපරීක්ෂාවක් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටිය හැකිය. ඕනෑම පරීක්ෂණයක් කරන්නට ප්‍රථම එමගින් සිදුවන්නේ කුමක්ද ? ප්‍රතිඵල ලබාගැනීමට කොපමණ කාළයක් ගතවේද? යන්න ඔබට සොයාගතහැකිය. සමහර අවස්ථාවල පින්තූර / ඡායාරූප රෝග අනාවරණයට උදව් කරගතහැකිවේ .පින්තූර ගැනීමට ඔබේ ලිඛිත අවසරය අවශ්‍යවන අතර පින්තූර ගැනීම ඔබට අවශ්‍යනම් ප්‍රතික්ෂෙප කළහැකිය. ප්‍රශ්න අසන ලෙසත් ලිඛිත තොරතුරු ඉල්ලාගන්නා ලෙසත් අප ඔබට නිර්දේශ කරමු. අවශ්‍ය නම් රෝහල්වල දෛද්‍ය පරිවර්තකයින් ඇත. අනාවරණයක් ලබාගත නොහැකි සමහර කාරණාවලදී පිළිතුරු නොමැත.

## මගේ මුණගැසීමට කොපමණ කාලයක් ගතවේද?

සාමාන්‍යයෙන් මුණගැසීමකට පැයක කාලයක් ගතවේ. නමුත් ඔබට ලේපරීක්ෂා, එක්ස්රේ සහ පින්තූර ගැනීමට සිදුවේනම් පැය දෙකක ඉඩක් තබාගත යුතුය. සමහරවිට මුණගැසීම්වලට වැඩි කාලයක් ගතවන හෙයින් එමනිසා ඔබට නැවතීමට සිදුවියහැකිය.